Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## සුබ නව වසරක් වේවා

බක් මහේ උදාවන අලුත් අවුරුද් පිළිබඳ සුන්දර මතක සටහන් අප සැමට ඇත. සමාජ ප්‍රගමණය හේතු කාරක වන චාරිත්‍ර වාරිත්‍ර වලින් ද සංස්කෘතියේ කඩපතක් වන් කෙළි සෙල්ලමින් ද කිරිබතින් කැවුම් කොකිස් ඈ නෙක රස මසවුළු වලින් ද පෝෂණය වන අවුරුද්ද පිළිබඳ අපේ මතකයේ රැඳී ඇති මිහිරියාව අපේ දරුවනටද ලබා දීඹඳම අපේ යුතුකමක් වන්නේ ය. වැඩිහිටියන් වූ දාට සිහිපත් කරන්නටත් සුන්දර අලුත් අවුරුද්දක් අපි අපේ දරුවනටත් ලබා දෙමු.

## කුඩු සහ කඩු

කුඩු සහ කඩු ගැන කතා නොකෙරෙන් දිනක් නැති තරමටම ඒ ව්‍යාධීන් දෙකම ශ්‍රී ලාංකික සමාජයේ ඔඩු දුවමින් ඇත .

හැත්තෑව දශකයේ ලංකාවට බෝ වූ කුඩු වසංගතය අද තරම් විවෘත හා භයානක ආකාරයකට ව්‍යාප්තව යතු අප දැක නැත. අද කුඩු ගෙන්වන්නෝ කවුදැයි සමාජය දනියි. කුඩු ගෙන්වන්නන් ආරක්ෂා කරන්නේ කවුදැයි ද සමාජය දනියි. ඒ දෙකම නොදන්නේ පොලීසිය පමණ් යනු කෙනෙකුට සිතෙන්නට බැරි නැත.

පොලීසියත් නොදන්නවා නොවේ. කුඩු ව්‍යාපාරයට දැන් ලැබී ඇති දේශපාලන අනුග්‍රහය හේතුවෙන් කළු ගලේ හිස ගසා ගන්නේ නැතිව සිටිය යුතු යයි කොන්ද පණ නැති පොලීසිය සිතන බව රහසක් නොවේ. දේශපාලකයන්ගේ ආශිර්වාදය මැද අද ජයටම සිදුවන කුඩු ව්‍යාපාරය පාරා වළල්ලක් වී ඒවාට අනුග්‍රහය දක්වන්නවුන්ටම පැමිණෙන දිනය දිනෙක උදා වන බව නම් නිසැකය. එහෙත් ඒ වන විට අපේ තරුණ පරම්පරාව කොයි අපායක වැටී සිටිනු ඇද්දැයි දන්නේ දෙවියන්ම පමණකි.

අපේ රජයේ ආගම දේශප්‍රේමය යයි සිතෙන තරමට දේශප්‍රේමය ගැන කතා කෙරෙනු අපට ඇසෙයි. එසේ කතා කරද්දීම අපේ දේශයේ උරුමයන් වන පුරාවස්තු මහජනතාවගේ ඇස් පනාපිටම මංකොල්ල කමින් තිබෙයි. කෞතුකාගාරයෙන් සොරා ගත් කඩු පමණක් නොව රජ පුරා ඇති විවිධ පූජනීය ස්ථාන වලින් සොරා ගන්නා ලද පුරා වස්තු වල වටිනා කම රුපියල් වලින් මිල කළ හැකි ද? මේ විනාශ කරමින් තිබෙනක ජාතික උරුම නැවත අපේ අනාගත පරම්පරාවට දැක බලා ගන්නට කිසිදා නොලැබෙන බව දැනෙන විද රට ගැන කැක්කුමක් ඇති හදවත් වලට දැනෙන වේදනාව කොපමණ ද?

මේ මං කොල්ලය මෙසේ සිදුවෙද්දී වගකිවයුත්තන් නිදි වැදී සිටින්නේ කඩු මංකොල්ලයත් රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුවන්නක් නිසා ද යන පැනය දැන් දැන් මහජනතාව අසමින් සිටිති.

කුඩු කාරයන්ට හා කඩු කාරයන්ට මේ රට බාර දී පැත්තකට වී සිටිමුද?

**සංස්කාකර - සන්නස**

# උඩ බලාගෙන කෙළ ගසන ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා නීතිපතිනිය

ශ්‍රී ලාල් ප්‍රියන්ත



මුළු ලෝකෙන්ම උතුම් රට ශ්‍රී ලංකාව යැයි කියමනක් තිබේ. උදේ හවා බණ දේසන බණ අසන සතර පෝයට සිල් සමාදම් වන සැදැහැවත් බෞද්ධ පිංවතුන් සතර දිග්භාගයේ වැහි වැහලාය. ලෝකයේ කොහේවත් නොමැති ආකාරයේ එක එක වෙයිවාරන් වල බෞද්ධ බැතිමතුන්ය.

වෙලාවකට කල්පනා කර බලන කළ මෙතරම් බණ කියන බණ අසන බෞද්ධානුකූලව සිය දිවි පෙවෙත කරගෙන යන බව කියන බෞද්ධ බැතිමතුන් සිටින රටක් තවත් ලෝකයේ නැතුවා වැනිය. එය එතරම්ම වු බෞද්ධ කීර්තිධර ධර්ම රාජ්‍යයකි. නමුත් වත්මන් සමාජ දේහය තුළ රටපුරා දිනපතා සිදුවන නරුම සිදුවීම් දෙස විපරම් කර බැලීමේදී මෙතරම් පව් වැඩ කරන මිනිසුන් ජීවත්වන පව්කාර රටක් තවත් ලෝකයේ තිබේද යන සිතුවිල්ලක් ද සිතට නැගේ.

දිනපතා පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය අසන බලන විට අපට ඉතාමත් පැහැදිලිව පෙනෙන්නේ ස්ත්‍රී දූෂණ, මිනීමැරුම්, මංකොල්ල කෑම්, මැර ක්‍රියා, වංචා ඇතුළු නොයෙක් ආකාරයේ විෂම ක්‍රියා ප්‍රබල ලෙස සමාජය පුරා සීග්‍රයෙන් වර්ධනය වෙමින් පවතින බවය. මේ සෑම ක්‍රියාවකම ක්‍රමික වැඩිවීමක් සිදුවනවා මිස කිසිදු අඩුවක් අපට පෙනෙන්නේ නැත. මෙය අනාගත සමාජයේ යහ පැවැත්මට එතරම් සුබවාදී තත්වයක් නොවේ. මින් පෙන්නුම් කෙරෙන්නේ අපගේ ශ්‍රී ලංකාදීපය ක්‍රමිකව අපරාධදීපයක් බවට පත්වෙමින් සිටින බවය. මිනී කන්නන්ගේ පව්කාරයන්ගේ රාජ්‍යයක් බවට පත්වෙමින් තිබෙන බවය.

මෙතරම් අසංවර තත්වයක් කරා අපේ රට පත්වීමට මූලික හේතුව කුමක්ද? ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා නීතිපතිනි ඊවා වනසුන්දර මහත්මිය ප්‍රකාශ කරන්නේ ''රට තුළ අපරාධ වැඩි වන්නේ පොලිසියේ වරදින්'' බවය.

ඇය කුමක්ද ප්‍රකාශ කළද, අපට පෙනෙන ආකාරයට නම්, රටේ අපරාධ වැඩිවීමට මූලික හා එකම හේතුව පොලිසිය නීතිමය ස්වභාවයන් ඉටු කිරීමේදී අනුගමනය කරන වැරදි සහගත තත්වයන්ම නොවේ. එය එක් කුඩා කරුණක් පමණි. නමුත් සැබෑ වශයෙන් රටේ අපරාධ වැඩි වීමට මූලික හේතුව පවතින දේශපාලන, ආර්ථික, සමාජ ස්වභාවය විශාල වශයෙන් පිටුවහලක් වී ඇති බව නොකියා බැරිය. සියලු පස් පව්වල මූලිකයා දේශපාලනයයි. රට තුළ ක්‍රියාත්මක අසමච්ජාති දේශපාලන සංස්කෘතිය මුලු සමස්ථ සමාජයම විනාශය කරා රැගෙන යමින් තිබේ.

නීතිපතිනී ඊවා වනසුන්දර මහත්මිය ප්‍රකාශ කරන ආකාරයට සියලු අපරාධ වල වගකිව යුත්තා පොලිසිය යැයි ප්‍රකාශ කරමින් සියලුම පව් පොලිසියේ කරමතින් දියකර පාකර හැරීමට ඇය කිසියම් උත්සාහයක නියැලෙනවා නම්, එය රටේ වගකිව යුතු නීති නිලධාරිනියක් වශයෙන් ඇය සිදු කරනුයේ සත්‍ය යටපත් කිරීමකි.

සැබෑ වශයෙන්ම රටේ අපරාධ වැඩිවීමට පොලිසිය කිසියම් ප්‍රමාණයකින් වග කිව යුතුය. ඒ ගැන කිසිදු තර්කයක් නැත. නමුත් එම වගකීමේ මූලිකයා පොලිසිය නොවේ. දේශපාලනයයි. බොහෝ අවස්ථාවල පොලිසියටත් සිය නීතිය හරියාකාරව ඉටු කිරීමට නොහැකිවී ඇත්තේ දේශපාලන බලපෑම් නිසාය. කොටින්ම කිවහොත්, පොලිසිය වත්මන් සමාජය තුළ දේශපාලනකරණයට ලක්වී තිබීම මීට මූලික හේතුව වනවාට සැක නැත.

භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනයේ ප්‍රධාන සැකකරුවා වන දුමින්ද සිල්වාව අත් අඩංගුවට ගැනීමට නොහැකි වී ඇත්තේ පොලිසියේ වරදින්ද ? නැත. එයට හරස් වී ඇත්තේ දේශපාලනය හා එහි ආවතේව වැඩ කරන නීතිපති දෙපාර්තමේන්තුවය. දුමින්ද සිල්වා හැර භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනයේ සියලුම සැකකරුවන්ව රහස් පොලිසිය මගින් අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇත. පොලිසියේ යම් යම් ප්‍රශ්න හා අඩුපාඩුකම් මධ්‍යයේ වුවද, තමන්ගේ රාජකාරිය කිසියම් සතුටුදායක මට්ටමකින් ඉෂ්ඨ සිද්ධ කර ඇත. දැනට අත් අඩංගුවට ගැනීමට සිටින්නේ මෙහි ප්‍රධාන ඝාතකයා වන දුමින්ද සිල්වාය. ඔහු මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේම ආනුභාවයෙන් රටින් පිටවී සිංගප්පූරුවට පැන ගොස් ජීවත්වේ. ඔහුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කොළඹ අධිකරණය රහස් පොලිසියට නියෝග කර ඇත.

රහස් පොලිසියටත් එම නියෝගය නිසි පරිදි ක්‍රියාවේ යෙදවීමේ අවශ්‍යතාවයක් ඇත. නමුත් දුමින්ද සිල්වා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ හොඳම ගෝලයා බැවින් ඔහුට

4 වන පිටට